SJSW 2025 5(1) : 52-72

Student Journal of Social Work (SJSW)
Volume 05 – Issue 01

05

# ශ්‍රී ලංකාවේ පරිවාස හා ළමා රක්ෂක සේවා ආයතන තුළින් සිදු කරන මෙහෙවරේ ඵලදායිතාව

# EFFECTIVENESS OF THE OPERATIONS CARRIED OUT BY THE PROBATION AND CHILD CARE SERVICES INSTITUTIONS IN SRI LANKA

**K.G.H. Nelum**
School of Social Work, National Institute of Social Development, Seeduwa, Sri Lanka
Email: piyaseeli89@gmail.com

## ABSTRACT

Children are widely regarded as the foundation upon which a nation's future is built, and their protection is a fundamental obligation of any society. Despite this, incidents of child abuse and violence against children have shown a continuous upward trend. International organizations, including the United Nations, have consistently emphasized the importance of safeguarding children's rights. However, the practical reality of child protection in Sri Lanka significantly diverges from these global standards. The family, as the smallest social unit, serves as the primary protective environment for children. Parental affection, care, and supervision are indispensable for a child's holistic development. In recognition of this, governments formulate and implement policies aimed at ensuring a safe and nurturing environment for children. At both national and regional levels, Sri Lanka has established state mechanisms dedicated to child protection. Among these, the Department of Probation and Child Care Services holds a particularly significant mandate in addressing the needs of abused, neglected, orphaned, and vulnerable children. This study undertakes a sociologically informed examination of the timeliness and effectiveness of interventions carried out by Probation and Child Protection institutions in responding to children exposed to abduction and related risks. The primary objective of the research is to identify key factors influencing the effectiveness of services provided to institutionalized children and to analyze the role of the social worker within this institutional framework. Additionally, the study investigates the availability and efficacy of educational opportunities for children in probation care and explores approaches to enhance community participation to promote the well-being of these children. Since the research adopts a secondary methodological approach, the analysis is based predominantly on existing secondary data and documented sources.

Both qualitative and quantitative analytical techniques are used to critically interpret the data in relation to the research questions. As institutionalized children represent a highly vulnerable segment of society, the timely and effective intervention of social workers is crucial in fulfilling the objectives of state child protection services. Accordingly, this research articulates the ways in which social workers can more effectively intervene to strengthen the role of probation and child protection institutions in ensuring a secure and productive future for institutionalized children.

**KEYWORDS:** Institutionalization, Family, Social Worker, Protection, Child

**සාරසංක්ෂේපය**

රටක අනාගතය දකින කැඩපත දරුවන් වන අතර දරුවන් කෙරෙහි ඇති ආරක්ෂාව ඕනෑම සමාජයක වගකීමකි. එහෙත් දරුවන් කෙරෙහි සිදු වන අපයෝජන, හිංසාවන් වර්තාවීම් දෛනිකව ඉහළ යමින් තිබේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු ජගත් සංවිධාන විසින් ළමා අයිතිවාසිකම් සුරැකීමේ අවශ්‍යතාව මනාව පෙන්වා දී ඇති අතර, ශ්‍රී ලංකාවේ ද ළමා අයිතිවාසිකම් සුරැකීම කෙරෙහි පවතින ප්‍රායෝගික යථාර්ථය හාත්පසින්ම වෙනස්ය. සමාජයේ කුඩාම සමාජ ඒකකය පවුල නම් වේ. පවුල යනු දරුවන්ගේ සුරක්ෂිතතාව ඇති කරන පෞද්ගලික අවකාශයකි. දරුවන්ගේ යහපත් සෞඛ්‍ය වර්ධනයට දෙමාපිය රැකවරණය හා සෙනෙහස අත්‍යාවශ්‍ය වෙයි. දරුවන්ට සුරක්ෂිත පරිසරයක් ඇති කිරීම උදෙසා සෑම ආණ්ඩුවක්ම ප්‍රතිපත්ති සම්පාදනය කර ක්‍රියාත්මක කරනු ලබයි. ළමයා සුරක්ෂිත කිරීමෙහිලා ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා රාජ්‍ය යාන්ත්‍රණයක් ගොඩ නැගී ඇත. ඒ අතර, අත්හල , අනාථ හා අසරණ දරුවන් කෙරෙහි කටයුතු කිරීමේ රාජ්‍ය යාන්ත්‍රණයක් ලෙස ළමා රක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වඩා වැදගත්වේ. පරිවාස හා ළමා රක්ෂණ සේවා ආයතන මගින් අපහරණයට ලක් වූ දරුවන් උදෙසා සිදු කෙරෙන මෙහෙවර කාලෝචිත වන්නේ කෙසේද? යන්න පිළිබඳව සිදු කෙරෙන සමාජ විද්‍යාත්මක විග්‍රහයක් මෙම අධ්‍යනය මගින් සිදු කරනු ලැබේ. මෙම පර්යේෂණය මගින් පරිවාසගත කරන ළමුන්ගේ ඵලදායිතාව වර්ධනය කිරීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධක හඳුනා ගැනීම හා එහි දී සමාජ වැඩකරුගේ කාර්යභාරය විග්‍රහ කිරීම පර්යේෂණයේ පරමාර්ථය වේ. පරිවාසගත දරුවන් සඳහා ඇති අධ්‍යාපනික ප්‍රවේශය හා එහි ඵලදායිතාව විමසා බැලීම මෙන්ම පරිවාසභාරයේ සිටින දරුවන්ගේ සුභසාධනය වෙනුවෙන් ප්‍රජා සහභාගිත්වය වැඩි කිරීම ආදී උප අරමුණු පිළිබඳව ද මෙම අධ්‍යනය මගින් විග්‍රහ කිරීම සිදු වේ. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන්හි ඵලදායීතාවය ඇගයීමේ මෙම පර්යේෂණය ද්විතීයික පර්යේෂණයක් වන බැවින් අධ්‍යයන ක්‍රමවේදය ප්‍රධාන වශයෙන් පවතින ද්විතියික දත්ත සහ තොරතුරු විශ්ලේෂණය මත පදනම් වේ. ද්විතීයික පර්යේෂණයේදී, එක්රැස් කරන ලද සියලුම දත්ත පර්යේෂණ ප්‍රශ්නවලට අදාළව විවේචනාත්මකව විශ්ලේෂණය කර අර්ථ නිරූපණය කිරීම වැදගත් වන අතර මෙහිදී ගුණාත්මක සහ ප්‍රමාණාත්මක විශ්ලේෂණ ක්‍රම දෙකම භාවිතා කරනු ලැබේ. සමාජයේ සංවේදී පිරිසක් වූ දරුවන් උදෙසා සිදු කරන ආයතනගතකරණය හා සම්බන්ධ රාජකාරියේදී එහි පරමාර්ථ ඉටු කර ගැනීමේ කාර්යභාරයට සමාජ වැඩකරුවකුගේ මැදිහත්වීම කාලෝචිත වේ. ඒ අනුව, ආයතනගත දරුවන්ගේ අනාගත ජීවිතය ඵලදායි කිරීමේ පරිවාස හා ළමාරක්ෂක ආයතන මගින් සිදු කෙරෙන මෙහෙවර තවදුරටත් සාර්ථක කර ගැනීම උදෙසා සමාජ වැඩකරුට ඵලදායි ලෙස මැදිහත් වීම සිදු කළ හැකි ආකාරය මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් පැහැදිලි කර දී ඇත.

**මුඛ්‍ය පද -** ආයතනගත කිරීම, පවුල, සමාජ වැඩකරු, සුරක්ෂිතතාව, ළමයා

**අධ්‍යයනය හැඳින්වීම**

රටක අනාගතය තීරණය කිරීමෙහිලා වැදගත්ම සාධක වන්නේ දරුවන් ය. දරුවන්ට කායික, මානසික, ලිංගික හිංසනයන් සිදු කිරීම හා දරුවන් නොසලකා හැරීම යන හිංසනයන් සිදුකිරීම තුළින් ඔවුන්ට තම ළමා කාලය වඩාත් ඵලදායිව හා සුරක්ෂිතව ගෙවීමට ඇති අවස්ථාවන් මගහැරී යයි. විශේෂයෙන් රටක ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ කර්තව්‍යයේදී සෑම බලයකටම වඩා ජන බලය ප්‍රබල හා ප්‍රමුඛත්වයෙහිලා සැලකිය හැකිය. එනම් මෙකී කටයුත්ත සඳහා ශ්‍රී ලංකාවේ ගම් මට්ටමේ සිට දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය හා ඒ වෙනුවෙන් සමස්ථ සමාජයම එකිනෙකාට බැඳුණු කැපවීමක අවශ්‍යතාව පැන නැගී ඇත.

ළමා සුරකුම් ආයතනවල සිදු කළ ළමා සංගහනයට අනුව ආයතනවල ළමයින්ගෙන් බහුතරයකට දෙමාපියන් දෙදෙනාම සිටි. ප්‍රධාන වශයෙන් එම දරුවන් ආයතනගත වී ඇත්තේ දරිද්‍රතාවය සහ දෙමාපියන්ගෙන් වෙන්වීම, අක්‍රීය පවුල් නිසා ය. එම පවුල් සඳහා මග පෙන්වීම සඳහා උපදේශන, මනෝ සමාජීය සහාය, සමාජ වැඩකරුවන්ගේ නිවෙස් බැලීමට සංවිධානය කිරීම නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට එහි යෝජනා කෙරේ. ඊට අමතරව හොඳ මාපියන් බවට පත් වීම හා දරුවන්ගේ මුල් ළමා විය සංවර්ධනය වැදගත්කම, ප්‍රාදේශීය මට්ටමින් පහසුවෙන් ප්‍රවේශ විය හැකි ළමා ආරක්ෂණ සේවා පිළිබඳ දැනුවත් කිරීම, ළමා අපයෝජන සහ ප්‍රචණ්ඩත්වයට එරෙහිව ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම මෙහිදී සාකච්ඡාවට ලක්වී ඇත (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ආයතනගත ළමුන් උදෙසා පවත්වනු ලැබූ ජන සංගණන වාර්තාව, 2019)

**පර්යේෂණ ගැටලුව**

පරිවාස හා ළමා රක්ෂණ සේවා ආයතන මගින් අපහරණයට ලක් වූ දරුවන් උදෙසා සිදු කෙරෙන මෙහෙවර කාලෝචිත වන්නේ කෙසේද? යන්න පිළිබඳව සිදු කෙරෙන සමාජ විද්‍යාත්මක විග්‍රහයක් මෙම අධ්‍යනය මගින් සිදු කරනු ලැබේ.

**පර්යේෂණයේ පරමාර්ථය හා අරමුණු**

මෙම පර්යේෂණය මගින් පරිවාසගත කරන ළමුන්ගේ ඵලදායිතාව වර්ධනය කිරීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධක හඳුනා ගැනීම හා එහි දී සමාජ වැඩකරුගේ කාර්යභාරය විග්‍රහ කිරීම පර්යේෂණයේ පරමාර්ථය වේ.

පර්යේෂණ අරමුණු ලෙස, දරුවන් පරිවාසගත කිරීමේ ප්‍රධාන යාන්ත්‍රණය ශක්තිමත් කිරීම උදෙසා රජයේ මැදහත්වීම විමසා බැලීම, පරිවාසගත දරුවන් සඳහා ඇති අධ්‍යාපනික ප්‍රවේශය හා එහි ඵලදායිතාව විමසා බැලීම මෙන්ම පරිවාස භාරයේ සිටින දරුවන්ගේ සුභසාධනය වෙනුවෙන් ප්‍රජා සහභාගිත්වය වැඩි කිරීම ආදී උප අරමුණු පිළිබඳව ද මෙම අධ්‍යනය මගින් විග්‍රහ කිරීම සිදු වේ.

**පර්යේෂණයේ වැදගත්කම**

ළමුන්ගේ අයිතීන් තහවුරු වූ ඔවුනට සංවේදී හිතකර පරිසරයක් ඇති කිරීමේ දැක්මකින් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාවේ පැරණිම දෙපාර්තමේන්තුවක් වන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ විකාශනය ඇති වන්නේ බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා සම්බන්ධ පරිවාස ක්‍රමය 1944 වර්ෂයේ අංක 22 දරණ පරිවාස ආඥා පනතින් අධිකරණ ක්‍රමයේ ස්ථාපිත වීමත් සමඟය. 1949 දී දිවයින පුරා සියළුම අධිකරණ කලාප ආවරණය වන පරිද්දෙන් පරිවාස සේවය ව්‍යාප්ත කෙරුණු අතර මෙම සේවාවේ පරිපාලන කටයුතු බන්ධනාගාර හා පරිවාස දෙපාර්තමේන්තු විසින් සිදුකර ඇත. ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත ක්‍රියාත්මක කිරීම හා ළමා උසාවි ආරම්භ කිරීමත් සමගම ළමයින් සඳහා සැපයෙන සේවාවන් එක්තැන් කිරීමක් වශයෙන් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව 1956 වර්ෂයේ ඔක්තෝබර් පළවෙනි දින ආරම්භ වූ අතර ආරම්භයේ සිට වර්තමානය දක්වා විවිධ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙයි. වර්තමානයේ දී පළාත් සභා ක්‍රමය යටතේ, පරිවාස හා ළමාරක්ෂක සේවාවේ පළාත් කොමසාරිස්වරුන් නම දෙනෙක් යටතට පත් කරන්න ලදී. විමධ්‍යගත කිරීමකින් ක්‍රියාත්මක වන අතර පරිවාස ආයතන 373 ක් 2019 වන විට ස්ථාපිත කර පවත්වාගෙන යනු ලබන අතර එහි පාලන කටයුතු පළාත් පරිවාස දෙපාර්තමේන්තු යටතට පත්කර ඇත. මෙම ආයතනය මගින් ද්වි ආකාරයකින් දරුවන්ගේ සුරක්ෂිතභාවය ඇති කරනු ලැබේ. එනම්, ළමා අපයෝජන වළක්වා ගැනීමේ මැදිහත්කරණය හා ළමා අපයෝජනයක් සිදුවූ අවස්ථාවන්හි මැදිහත්කරණය වශයෙනි (පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, 2025).

මෙම ආයතනය මගින් ළමා ආරක්ෂක සේවාවව සම්බන්ධයෙන් මැදිහත්කරණ කටයුතු සිදු කිරීම, දෙමාපියන් හා දරුවන් යන දෙපාර්ශවයටම අපයෝජනය පිළිබඳව දැනුවත් කිරීම් සඳහා වැඩමුළු, සමළු, සැසි සංවිධානය කිරීම හා පැවැත්වීම, ළමා අපයෝජනයක් සිදුවීමක් වාර්තා වූ අවස්ථාවන්හිදීම පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව අධිකරණයට වාර්තා කර අපයෝජන සිදුවීම් සම්බන්ධව මනෝ උපදේශන ලබාදීම, අවශ්‍යතාවය මත මනෝ ප්‍රතිකාර සඳහා යොමු කරවීම, ළමුන්ගේ මානසික තක්සේරුකරණයක් සිදු කිරීම, ළමයාට නෛතික ආරක්‍ෂාව හා මනෝ සමාජීය යහපැවැත්ම තහවුරු කරදීම, පවුලේ සාමාජිකයන් සමඟ සාකච්ඡා පැවැත්වීම, පවුලේ සාමාජිකයින්ට ළමයා සම්බන්ධ වගකීම භාරදීම හෝ දරුවාට සුරක්ෂිත පරිසරයක් ඇති කිරීම, ළමයාගේ වගකීම භාර ගැනීමට වැඩිහිටියන් ඉදිරිපත් නොවන අවස්ථාවන්හිදී එම දරුවන් පරවාසභාරයට පත් කිරීම ආදී කටයුතු සිදු කරනු ලැබේ (පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, 2025). විශේෂයෙන් සැලකිල්ලක් දැක්විය යුතු වින්දිත, අසරණ හා අනාථ දරුවන්ට සේවා සපයන මෙම ආයතනයන්හි සේවාවල ප්‍රායෝගික ගැටලු රාශියක් වර්තමානයේ දී දැකගත හැකිය. ඒවා අතර එහි පවතින යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම සම්බන්ධ ගැටලු, දරුවන්ගේ ආරක්ෂිත තත්ත්වය, සෞඛ්‍ය ගැටලු, අධ්‍යාපන ගැටළු සම්පත් දායකයින්ගේ හිඟකම ආදිය පෙන්වා දිය හැකිය (ජයසේන සහ වෙල්ගම, 2022).

මෙවැනි ප්‍රායෝගික ගැටලු නිරාකරණය කර වඩාත් හොඳ සේවාවක් සැපයීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ට හා වෘත්තීකයන්ට වඩා හොඳ තීරණ ගැනීමට, සේවා සැලසුම්

සකස් කිරීමට ක්‍රියාත්මක කිරීමට හා එහි ඵලදායිතාව වැඩි කිරීමට මෙම පර්යේෂණය මගින් සාක්ෂි සැපයීම සිදු කරනු ලබයි. එසේම අඩුඵලදායී ක්‍රම වෙනස් කිරීමට හෝ ඉවත් කිරීමටද දායකවේ. සීමිත සම්පත් වඩාත් ඵලදායිව යොදා ගැනීමටත් වාර්ෂික අයවැය මගින් රජයේ මැදිහත්කරණය මේ සම්බන්ධයෙන් වැඩි කිරීමටත් මෙම පර්යේෂණය මගපෙන්වනු ලබයි. මෙම ආයතනවල පවත්වාගෙන යනු ලබන ගිණුම්කරණය හා වගකීමේ කාර්ය සාධනය ඇගයීමට ලක් කිරීම හා දරුවන්ගේ වෘත්තිය සංවර්ධනය දිරිමත් කිරීම හා එම දරුවන් වැඩ ලෝකයට මඟ පෙන්වීමට රජයේ මැදිහත්වීමේ වගකීම  මගින් තවදුරටත් පෙන්නුම් කිරීම සිදුකරනු ලබයි. එසේම පරිවාසගත දරුවන්ගේ හා පවුල්වල යහපැවැත්ම වැඩි කිරීමටත්, අවධානයට ලක්ව සිටින දරුවන්ගේ පවුල්වලින් සහයෝගය වැඩි දියුණු කිරීමටත්, ඔවුන් සඳහා මඟ පෙන්වීම වැඩි කිරීම  හා දැනුවත් කිරීම් කටයුතු සිදුකිරීමත්, මෙම දරුවන් කෙරෙහි සමාජ ආරක්ෂණ කටයුතු වැඩි කිරීම හා ළමා සංවර්ධන අවදි සම්බන්ධයෙන් සමාජ දැනුවත්භාවය වර්ධනය කිරීමේ වැදගත්කම පෙන්වාදීමටත්, රටෙහි වටිනාම සම්පත වූ අනාගත දරු පරපුර රැක ගැනීමේ මෙහෙවර පෙන්වාදීමටත්, එමෙන්ම මෙම සමාජීය වැදගත්කමක් පවතින ආයතනගත දරුවන් ඵලදායිතාවයෙන් යුතුව සමාජයට දායක කිරීමේ වටිනා මෙහෙවරට මැදිහත්කරණ කාර්යයේදී සමාජ වැඩකරුවකුගේ කාර්යභාරය පෙන්වාදීමත් මෙම අධ්‍යයනය මගින් සිදු කරනු ලබන වැදගත් මෙහෙවරක් ලෙස සඳහන් කළ හැකිය.

**අධ්‍යනය ක්‍රමවේදය**

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන්හි ඵලදායීතාවය ඇගයීමේ මෙම පර්යේෂණය  ද්විතියික පර්යේෂණයක් වන බැවින් අධ්‍යයන ක්‍රමවේදය ප්‍රධාන වශයෙන් පවතින ද්විතියික දත්ත සහ තොරතුරු විශ්ලේෂණය මත පදනම් වේ. මෙහිදී නව දත්ත එක්රැස් කිරීමක් සිදු නොවන අතර, දැනටමත් එකතු කර ඇති දත්ත, වාර්තා, අධ්‍යයනයන් සහ ප්‍රකාශන උපයෝගී කර ගනිමින් පර්යේෂණ ගැටලුවට අදාළ නිගමනවලට එළඹීම අපේක්ෂා කෙරේ.

ලේඛන සමාලෝචනය

1. දෙපාර්තමේන්තු වාර්තා: පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වාර්ෂික වාර්තා, කාර්යසාධන වාර්තා, ක්‍රියාකාරී සැලසුම්, සහ ප්‍රතිපත්ති ලේඛන අධ්‍යයනය කිරීම. මේවා මඟින් දෙපාර්තමේන්තුවේ ඉලක්ක, ක්‍රියාකාරකම්, සහ ඒවායේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා ගත ගැනීම සිදු කෙරේ
2. නීතිමය ලේඛන: ළමා ආරක්ෂාව, පරිවාස කටයුතු, සහ අදාළ නීති රෙගුලාසි පිළිබඳ පවතින නීතිමය ලේඛන සහ සංශෝධන සමාලෝචනය කිරීම
3. ව්‍යාපෘති වාර්තා: දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද හෝ සහභාගී වූ ව්‍යාපෘතිවල තක්සේරු වාර්තා සහ අවසන් වාර්තා විශ්ලේෂණය කිරීම

පවතින පර්යේෂණ අධ්‍යයන විශ්ලේෂණය

1. ශාස්ත්‍රීය ලිපි සහ සඟරා: ළමා ආරක්ෂාව, සමාජ සේවා, පරිවාස කටයුතු, සහ ප්‍රතිපත්ති ඵලදායීතාවය පිළිබඳ ප්‍රකාශිත ශාස්ත්‍රීය ලිපි සහ පර්යේෂණ සඟරා අධ්‍යයනය කිරීම
2. ශාස්ත්‍රපති නිබන්ධන: විශ්වවිද්‍යාලවලින් ප්‍රකාශිත අදාළ නිබන්ධන සමාලෝචනය කිරීම

දත්ත සමීක්ෂණ සහ සංඛ්‍යාලේඛන විශ්ලේෂණය

1. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව වැනි ආයතන මඟින් ප්‍රකාශිත ළමා අපචාර, ළමා අපරාධ, පරිවාසගත පුද්ගලයන්, සහ සමාජ සුභසාධන දත්ත විශ්ලේෂණය කිරීම සම්බන්ධ 2019 දී සිදු කරන ලැබූ ජනසංගහන වාර්තාව
2. ජාත්‍යන්තර සංවිධාන වාර්තා: UNICEF, ILO, WHO වැනි ජාත්‍යන්තර සංවිධාන වල ළමා ආරක්ෂාව සහ සමාජ සුභසාධන කටයුතු පිළිබඳ වාර්තා සහ සංඛ්‍යාලේඛන

ද්විතීයික පර්යේෂණයේදී, එක්රැස් කරන ලද සියලුම දත්ත පර්යේෂණ ප්‍රශ්නවලට අදාළව විවේචනාත්මකව විශ්ලේෂණය කර අර්ථ නිරූපණය කිරීම වැදගත් වන අතර මෙහිදී ගුණාත්මක (Qualitative) සහ ප්‍රමාණාත්මක (Quantitative) විශ්ලේෂණ ක්‍රම දෙකම භාවිතා කරනු ලැබේ.

**සාහිත්‍ය විමර්ශණය**

අවුරුදු 18 ට අඩු සෑම පුද්ගලයෙකුම ළමයකු වන අතර 1989 එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ පළමු වන ව්‍යවස්ථාව තුළින් එය නිර්වචනය කර ඇත (ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, 2002). ඒ අනුව එකී පනතේ ඇති සියලු අයිතිවාසිකම් අවුරුදු 18 ට අඩු සෑම පුද්ගලයකුටම භුක්ති විඳීමට සැලැස්වීමත්, ළමයාගේ ආරක්ෂාව, සංවර්ධනය, පැවැත්ම හා සහභාගිත්වය තහවුරුකර ලබා දීමත් සියලු වැඩිහිටියන්ගේ වගකීමක් වේ. පොදු ජාත්‍යන්තර මතය මෙය වුවත්, ශ්‍රී ලංකාවේ නීතියෙන්, නීතියට වරදේ ස්වභාවය මත ළමයා යන්න නිර්වචනය වීමේ වයස් සීමාවන් වෙනස් වෙයි. එය කෙසේ වුවත් පොදු පිළිගැනීම හා ජාතික ළමා ආරක්ෂක අධිකාරී පණතේ 40 වැනි වගන්තියේ ළමයා යන්නෙන් වයස අවුරුදු 18 ට අඩු තැනැත්තෙකු අදහස් කළ යුතු බව දක්වා ඇත (එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය, 1989).

ළමයින්ට විරුද්ධව සිදුවන ප්‍රචණ්ඩත්වයන් සූරාකෑම් හා අපයෝජනයන් වැළැක්වීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලිය ළමා ආරක්ෂාව යටතේ සාකච්ඡා කරයි (UNICEF, 2019). මෙය තවදුරටත් පැහැදිලි කරන්නේ නම් "ප්‍රචණ්ඩත්වය, සූරාකෑම, නොසලකා හැරීම්, ළමා අයිතිවාසිකම් උදුරා ගැනීම සහ සියලු ආකාරයේ අපයෝජනයන්ට එරෙහිව ප්‍රතිචාර දැක්වීමට, ප්‍රතිකාර කිරීමට හා ඒවා වැළැක්වීමට නිර්මිත සඵලදායි ක්‍රියා පටිපාටින් හා ව්‍යුහයන් ඇතුළත් ක්‍රියාවලියක් ලෙස ළමා ආරක්ෂාව පැහැදිලි කළ හැකිය (ළමා ආරක්ෂාව පිළිබඳ අත්පොත, 2019). ළමයින්ට සිදුවන අපරාධ හා හිංසන වැළක්වීමේ ප්‍රතිපාදන

ප්‍රථමවරට අන්තර්ගත කරන ලද්දේ 1833 දණ්ඩ නීති සංග්‍රහය තුළය. විවිධාකාර වැරදි පිළිබඳ අර්ථ දක්වා ඊට ලැබිය යුතු දණ්ඩන නියමයන් පිළිබඳ විස්තර දැක්වීම දණ්ඩ නීති සංග්‍රහයට අයත් මූලික කාර්යභාරයයි. දණ්ඩ නීති සංග්‍රහය වරින් වර සංශෝධනය කරමින් ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට පුළුල් ප්‍රතිපාදන ගෙන එන ලදී. මෙම දණ්ඩ නීති සංග්‍රහයට අනුව ළමයින්ට එරෙහිව සිදුවන අපරාධ ලෙස පහත සඳහන් දෑ හඳුනාගෙන ඇත.

1. ළමයින්ට එරෙහිව සිදුකරන ලබන අසභ්‍ය පළ කිරීම්/ ප්‍රදර්ශනය
2. ළමයි සිඟමනේ යෙදවීම
3. සීමිත භාණ්ඩ ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයෙහි යෙදවීම
4. ගබ්සා කිරීම
5. ළමයින්ට කුරු වද හිංසාවලට භාජනය කිරීම
6. පහර දීම හා තුවාල සිදු කිරීම
7. බරපතල තුවාර සිදු කිරීම
8. ලිංගික අතවර සිදු කිරීම
9. පැහැරගෙන යාම
10. අපහරණය
11. බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම
12. කුට්ටනය
13. ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම
14. තැනැත්තන් වෙළඳාම් කිරීම
15. දරුකමට හදා ගැනීමට අදාල වැරදි
16. ලිංගික අපයෝජනය සඳහා ළමයකුට ඇවටිලි කිරීම
17. ස්ත්‍රී දූෂණය
18. ව්‍යභිචාරය
19. අස්වාභාවික වැරදි
20. තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා
21. බරපතල ලිංගික අපයෝජනය (දණ්ඩ නීති සංග්‍රහය, 1833).

ළමා ආරක්ෂාව සහශ්‍ර සංවර්ධන ඉලක්කයන්හි ප්‍රමුඛතාවයකි. පසුගිය දශක කිහිපය තුළ සිදුකළ අධ්‍යයනය මගින් පෙන්වා දී ඇති පරිදි ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ළමා රැකවරණ මධ්‍යස්ථාන දෙවර්ගයෙහිම දරුවන් හට ආරක්ෂාව හා රැකවරණය සැපයීමේදී උග්‍ර අඩුපාඩු පවතී. ආයතනගත දරුවන් සඳහා ආරක්ෂක නිලධාරීන් ප්‍රමාණවත් නොවීම, නිරීක්ෂණ කැමරා, ආරක්ෂක තාප්ප, වයස් කාණ්ඩ අනුව ළමුන් වෙන් නොකිරීම වැනි තීරණාත්මක ගැටළු රාශියක් පවතී. ජල සැපයුම් අඩාල වීම්, ගිලන් කාමර නොමැති වීම, සනීපාරක්ෂක කළ පාසල් නොමැති වීම, ලිංගික අතවරණයට ලක් වූ ළමුන් වෙන්කර රැඳවීම සඳහා ස්ථානයක් නොමැති වීම, ප්‍රවාහන සම්බන්ධ ගැටලු, ආරක්ෂක නිලධාරීන් ප්‍රමාණවත් නොවීම ආදී ආයතනික ව්‍යුහය යටතේ උද්ගතව ඇති ගැටලු කිහිපයකි. එසේම පාසල්වලට ළමුන් ඇතුළත් කිරීමේදී වෙන් කොට සැලකීම, අධ්‍යාපන අවස්ථා ප්‍රමාණවත්

නොවීම සහ සම්පත් ප්‍රමාණවත් නොවීම ළමුන්ගේ සමාජානුයෝජනයට අහිතකර ලෙස බලපාන බව පෙන්වා දී ඇත (ජයසේන සහ වෙල්ගම, 2022).

පරිවාස සේවය යනුවෙන් අදහස් කරනුයේ, ආයතනගත කිරීමක්, සිරගත කිරීමක්, වෙනත් මූල්‍යමය දණ්ඩනයකට හෝ වෙනත් දණ්ඩනයකට යටත් කිරීමකින් තොරව වරදකරුවෙකු පුනරුත්ථාපනය කිරීමයි. මෙමගින් අදහස් කරන්නේ වරදකරුවන් වන ළමුන් පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ තබාගෙන එම ළමුන්ට ඔවුන්ගේ නිවස තුළම ජීවත්වීමට අවකාශ සලසා දීම වෙයි. එනමුත් 1944 අංක 42 දරණ වරදකරුවන් පරිවාස ආඥා පනතේ 03 වන වගන්තිය අනුව වරදක ස්වභාවය, ස්ත්‍රී පුරුෂභාවය සහ ඔහුගේ තත්ත්වය සැලකිල්ලට ගනිමින් වරදකරුවන් වුවහොත් ඔහුගේ කැමැත්ත ඇතිව පරිවාස නියෝග පැනවිය හැකිය. මෙම පරිවාස සේවය දරුවන්හට ආයතනගත සහ ආයතනගත නොවන යන දෙයාකාරයෙන්ම ලබා දෙන ආකාරයක් දැක ගත හැකිය. ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව අනුගත වෙමින් ළමුන්ගේ සුභසාධනය වෙනුවෙන් වැඩසටහන් රැසක් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් සපයනු ලැබේ. ඒ අනුව පාසල් නොයන ළමුන් පාසල් ගත කිරීම කිරීම, විවිධ කැපකරු ශිෂ්‍යත්ව සහ ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ශ්‍රී ලංකාවේ ළමා ඇතිවාසිකම් ප්‍රඥප්තිය ප්‍රාදේශීය කමිටු හරහා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම, පරිවාස භාරයට පත්වූ ළමයින් නැවත සමාජගත කිරීමට අවශ්‍ය වැඩපිළිවෙළ සැකසීම පර්යේෂණ සහ සමීක්ෂණ සිදු කිරීම, පුහුණු වැඩසටහන් දියත් කිරීම, ළමා මිතුරු ගම්මාන සහ ළමා නිවාස සඳහා අදාළ සේවා ලබාදීම ආදී කාර්යභාරය රැසක් ඉටු කරනු ලබයි (පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව, 2015).

මානව අයිතිවාසිකම් ආරක්ෂා කරමින් සමාජ සංවර්ධනය තහවුරු කිරීම සඳහා දෙවන ලෝක යුද්ධයෙන් පසුව එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහි විය. 1989 වර්ෂයේ නොවැම්බර් මස 20 දින එක්සත් ජාතීන් විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය අත්සන් කරන ලදී. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය 1990 සැප්තැම්බර් 22 වන දා සිට ක්‍රියාත්මක විය. වගන්ති 54 කින් යුත් මෙම එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය ශ්‍රී ලංකාව විසින් 1991 ජනවාරි 26 වනදා අත්සන් කරන ලද අතර 1991 ජූලි 12 වැනිදා සිට ක්‍රියාත්මක කරන ලදී. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය මගින් ලොව පුරා සිටින ළමයින් උදෙසා අයිතිවාසිකම් හඳුන්වා දෙන ලදී. එහිදී ළමයින්ගේ සෞඛ්‍ය, අධ්‍යාපනය හා සමාජ ආරක්ෂාව මූලික අවශ්‍යතා වශයෙන් හඳුන්වා දෙමින් ළමයින් හට ක්‍රීඩා කිරීමට තම අදහස් ප්‍රකාශ කිරීමට හා විනෝදයෙන් සිටීමට ඇති අවශ්‍යතාවය ද සඳහන් කරන ලදී (එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, 1989).

වයස අවුරුදු 14ට අඩු අය "ළමයින්" ලෙසත්, අවුරුදු 14 සහ 16 අතර අය "යෞවනයන්" ලෙසත් හඳුන්වයි. ළමයින් හා යෞවනයන් සම්බන්ධ නඩු විභාග කිරීමේ අධිකරණ බලය යටතේ හෝ වෙනත් නීතියක් යටතේ චෝදනාලත් ළමයකු හෝ රැකවරණය හා ආරක්ෂාව අවශ්‍ය ළමයකු සම්බන්ධයෙන් කටයුතු කිරීමට පිහිටුවා ඇති මහේස්ත්‍රාත් අධිකරණයක් ළමා අධිකරණයක් වේ. ළමා උසාවි කාර්ය පටිපාටිය සාමාන්‍යයෙන් ළමා උසාවියක් මහේස්ත්‍රාත් උසාවි ගොඩනැගිල්ල තුළ හෝ මහේස්ත්‍රාත්තුමාගේ නිල කාමරයේ පැවැත්වේ. ළමා උසාවි කටයුතු මහජනතාවට විවෘත නොවේ. ළමයාට විරුද්ධව ඇති චෝදනාව ඉතා

ලිහිල් භාෂාවකින් අධිකරණය විසින් ළමයාට තේරුම් කර දිය යුතුය. ළමා උසාවියේ නඩුවක් විභාග කරන විට අධිකරණය තුළ රැඳී සිටීමට අවසර ඇත්තේ උසාවියේ නිලධාරීන්ට හා එම නඩුවට සෘජුවම සම්බන්ධ පුද්ගලයන්ට පමණි. ළමයා තමන් වරද කළ බව පිළිගතහොත් අධිකරණය ළමයාගේ භාරය ආරක්ෂාව හා පුනරුත්ථාපනය සඳහා වඩාම සුදුසු නියෝගය සිදුකරයි. ළමයා වරද පිළි ගතහොත් හෝ වරද සිදු කර ඇති බව අධිකරණය තීන්දු කළහොත් දඬුවම් ලිහිල් කිරීම සඳහා කරුණු දැක්වීමට ළමයාට අවස්ථාවක් දෙනු ලැබෙයි. දඬුවම නියම කිරීමට පෙර ළමයාගේ සමාජ පසුබිම හා පෙර හැසිරීම පිළිබඳ පරිවාස නිලධාරියෙකුගෙන් වාර්තාවක් කැඳවීමට උසාවියට හැකිය. ළමයා වරද නොපිළිගන්නේ නම් අධිකරණය දෙපාර්ශවයම විමසා නඩුව තීන්දු කරයි (පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව, 2015).

ළමා උසාවියකට පැනවිය හැකි දඬුවම් ලෙස, මසකට නොවැඩි කාලයක් රැඳවුම් නිවාසයක රඳවා තැබීම, අනුමත කළ පාසලකට හෝ සහතික කළ පාසලකට යැවීම (එය සිදුකළ හැක්කේ වයස අවුරුදු දොළහට වැඩි ළමයින්ට පමණි.), වසරක කාලයක් යහපත් කල් ක්‍රියාවෙන් විසීමේ කොන්දේසිය මත දෙමාපියන්ට හෝ භාරකරුට භාරදීම, අවුරුදු 03 නොවැඩි කාලයක් සඳහා ළමයා භාර ගැනීමට කැමති සුදුසු පුද්ගලයකුගේ රැකවරණය යටතේ ළමයා තැබීම, කොන්දේසිවලට යටත්ව ළමයා මුදා හැරීම, පරිවාස නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ තැබීම, ළමයා වෙනුවෙන් දඩයක් ගෙවන ලෙසට දෙමාපියන්ට හෝ භාරකරුට නියම කිරීම, කායික දණ්ඩනය පැනවීම පිරිමි ළමයෙකුට සැහැල්ලු ඒ වැලකින් පහරවල් හයක් ගැසීමට නියම කිරීම හා අවවාද කොට මුදා හැරීම සිදු කළ හැකිය. ළමුන් සඳහා රැඳවුම් නිවාස හා සහතික කළ පාසල් පිහිටුවීමට පනත මගින් විධිවිධාන සලසා ඇත. ඒවා පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ රජය මගින් පාලනය කෙරෙන ආයතනය වේ (ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත, 1939).

2015 අංක 01 දරණ ළමයි අනිවාර්යෙන් පාසල්වලට පැමිණීමේ නියෝග ප්‍රකාරව, අනිවාර්ය අධ්‍යාපන වයස යනුවෙන් හඳුන්වනු ලබන්නේ, වයස අවුරුදු 5 ට නොඅඩු සහ අවුරුදු 16 ට නොවැඩි කාලයකි. එසේම, සෑම ළමයෙකුගේම දෙමාපියන් විසින් ඒ ළමයාගේ අධ්‍යාපනය සඳහා වෙනත් අයුරකින් ප්‍රමාණවත් හා සුදුසු විධිවිධාන සලස්වා ඇත්නම් මිස නිතිපතා පාසලට පැමිණ අධ්‍යාපනයක් ලැබීමට ඒ ළමයාට කටයුතු සලස්වා දිය යුතුය. වර්තමාන ශ්‍රී ලංකාවේ ළමාරක්ෂණ ආයතන 379 ක ළමුන් 10,632 ක ජීවත් වෙති. මධ්‍යම රජය යටතේ ඇති පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තු මගින් පාලනය වන පුහුණු හා උපදේශනය හැර අනෙක් ආයතන සියල්ලම ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ විෂය යටතට අයත් වෙයි.

ආයතනිකරණය අඩු කිරීමට රාජ්‍ය ආයතන දරන උත්සාහයන් සැලකිල්ලට ගැනීම දිරිගන්වන සුලුය. පසුගිය දශකය කෙසේ වෙතත් දරුවන් ආයතනගත කිරීමට හේතු හඳුනා ගැනීම සහ ළමාරක්ෂක ආයතන සඳහා ඵලදායී අධීක්ෂණ යාන්ත්‍රණයක් අනුගමනය කිරීමද වැදගත් වන අතර හැකිතාන් දරුවන් සමාජයට සමාජගත කිරීමට වග බලා ගැනීම වැදගත් වේ. ශ්‍රී ලංකාවේ පළාත් 09 අතර සෑම පළාතකටම පරිවාස හා ළමාරක්ෂක සේවා සඳහා පළාත් කොමසාරිස්වරයෙක් කටයුතු කරන අතර, සියලුම පළාත් මට්ටමේ පරිවාස නිලධාරීන් ඔවුන්ගේ පළාත් පරිවාස කොමසාරිස්වරුන් වෙත සෘජුවම වාර්තා කරයි. රැකවරණය සහ ආරක්ෂාව අවශ්‍ය හෝ නීතියට පටහැනි ළමයින් සඳහා ඔවුන්ගේ

තත්ත්වයන් අනුව පුළුල් පරාසයක සේවය කිරීම සඳහා විශේෂිත ළමා ආරක්ෂණ ආයතන 08 ක් රට තුළ පිහිටුවා ඇත (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංගණන වාර්තාව, 2019).

ළමා හෝ තරුණ අපරාධකරුවන් අධිකරණයේ විභාග වන නඩු තිබියදී රඳවා සිටින රිමාන් නිවාස සංඛ්‍යාව 14 කි. මෙම ළමා තරුණ අපරාධකරුවන් මිනීමැරුම්, සොරකම්, ස්ත්‍රී දූෂණ, ලිංගික අපරාධ, ගිනි තැබීම්, ආරවුල්, නීති විරෝධී මත්පැන් හෝ මත්ද්‍රව්‍ය භාවිතය වැනි අපරාධ සම්බන්ධයෙන් චෝදනා ලැබ රඳවා තබා ඇත. මීට අමතරව අධිකරණ නඩුවක් අවසන් වනතුරු සංක්‍රාන්ති නිවාසයක් ලෙස දරුවන් සුරක්ෂිතව තබා ගැනීම සඳහා රජයේ පාලන නිවාස 04 ක් ඇති අතර, ආයතන 09 ක් වෘත්තීය පුහුණු සඳහා පිහිටුවා ඇත. අපරාධවලට ගොදුරු වූ ළමයින් අපරාධකරුවන් සහ රැකවරණය සහ ආරක්ෂාව අවශ්‍ය දරුවන් සහතික කළ පාසල් ලෙස හඳුන්වන ආයතනවලට ඇතුළත් කරගන්නා අතර එක් අනුමත පාසලක් ඇත. එය රැකවරණය සහ ආරක්ෂාව පමණක් නොව අවශ්‍ය ළමුන් සඳහා නවාතැන් මනෝවිද්‍යාත්මක සහ කායික සහාය ලබා දෙයි (ළමා නිවාස ළමුන් පිළිබඳ සංගණනය, 2019)

පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් අතරට අනාථ, අත්හළ, අසරණ හා අපයෝජනයට ලක්වූ ළමුන්ට රැකවරණය සලසන ආයතන ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම, නියාමනය හා එවැනි ආයතන සඳහා පහසුකම් සැලසීමද එම දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කරමින් නේවාසික රැකවරණය සැලසීම අධ්‍යාපනයේ පෝෂණය හා වෘත්තිය පුහුණුව ලබාදීම, කුල වද්දා ගැනීමට අපේක්ෂිත තැනැත්තං වෙත දරුවන් භාර දෙමින් සමාජගත කිරීමද, කැපකරු මවුපිය ක්‍රමය යටතේ දරුවන් සඳහා සුදුසු කැපකාර දෙමාපියන් ලියාපදිංචි කිරීමද, ළමුන්ගේ පුනරුත්ථාපනය සඳහා දෙපාර්තමේන්තුව පාලනය යටතේ සහතික කළ පාසල් පවත්වා ගෙනයාමද, දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා හෝ දරුවන්ගේ යහපත උපරිම කිරීම සඳහා නඩත්තු ආධාර ලබාදීම, භාණ්ඩ උපකරණ ආදිය සැපයීම, කාර්ය මණ්ඩල පුහුණුව ලබාදීම ද, ළමුන් තාවකාලිකව රඳවා ගැනීමට අපේක්ෂිත නිවාස පවත්වාගෙනයාම ද, අවුරුදු 18 ට අඩු ගර්භනී ළමුන් හා 18 ට අඩු ළමා මව්වරුන් හා ඔවුන්ගේ රැකවරණය ලබා දෙන ළමා රැකවවරණ මධ්‍යස්ථාන පවත්වාගෙන යාම ද, අනාථ, අත්තල, අසරණ හෝ අපයෝජනයට ලක්වීම හේතුවෙන් නිසි භාරය රැකවරණය පෝෂණය හා නඩත්තුව නොලැබෙන වෙනත් නීතියකින් ප්‍රඥප්තියකින් හෝ ආවරණය නොවන ළමුන් සඳහා පෝෂණය හා අධ්‍යාපන ආධාර ලබා දීම ද, ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා අපයෝජන අවම කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කර පැවැත්වීමද, අනාරක්ෂිත වාසය කිරීමට නිවසක් නොමැතිවීම හේතුවෙන් ළමා නිවාසගත ළමුන් නැවත පවුල් තුළට යොමු කිරීම සඳහා ළමා සංවර්ධන මධ්‍යස්ථානගතවීම වළක්වා ස්වකීය පවුල තුළම රඳවා ගැනීමේ අරමුණින් පිළිසරණය ආධාර ලබාදීමද, අසරණ ළමුන් ළමා සංවර්ධන මධ්‍යස්ථානගත කිරීම වැළැක්වීම සඳහා ස්වයං රැකියා සඳහා පුහුණුව ලබාදීම හා අවශ්‍ය පහසුකම් සැලසීම ද, කුල වැදුම් නඩුකරවලදී නඩුවේ භාරකරු ලෙස කටයුතු කරමින් අධිකරණය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සහ ළමුන්ට අදාළ වෙනත් සිවිල් අධිකරණ ක්‍රියාමාර්ගයන්හිදී අධිකරණය මගින් ඉල්ලා සිටින වාර්තා සැපයීමද, අධ්‍යාපන ආයතන ළමා අපයෝජනයක් හෝ අපචාර ක්‍රියාවක් හෝ ළමා හිමිකම් නිසි පරිදි ආරක්ෂා නොවන බව වාර්තා වූ විට ඒ පිළිබඳව පූර්ණ

විමර්ශනයක් සිදු කර අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග සඳහා යොමු කිරීමද ආදී කාරණා පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යභාරය යටතට ගැනේ (පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව, 2025).

**"අත්හළ"** යන්නෙන්, නීත්‍යානුකූල විවාහ වූ දෙමාපියන්ට උපන් දරුවෙකු වන විට දෙමාපියන් දෙදෙනාම විසින් අතහැර දමා තිබීම, එක් අයෙකු විසින් අත්හැර අනෙක් තැනැත්තා මියගොස් තිබීම හෝ දෙමාපියෙකු වශයෙන් ක්‍රියා කිරීමට නොහැකි වීම, දෙමාපියන් දෙදෙනාටම දෙමාපියන් ලෙස ක්‍රියා කිරීමට නොහැකි වීමකදී සහ නීත්‍යානුකූල විවාහයක් නොමැති විටදී මව විසින් දරුවා අතහැර දමා තිබීම හෝ මවට දෙමාපියකු වශයෙන් ක්‍රියා කිරීමට නොහැකි විටදී හෝ අධිකරණ යෝගයක් මත භාරකාරීත්වය පැවරී ඇති අවස්ථාවක අදාළ නෛතික භාරකරු විසින් අත්හැර දමන ලද එවැනි අවස්ථාවකට පත් වූ ළමයෙකු අදහස් වෙයි.

**"අනාථ"** යන්නෙන්, නීත්‍යානුකූලව විවාහ වූ දෙමාපියන්ට උපන් ළමයෙක් නම් දෙමාපියන් දෙදෙනා මියගිය එක් අයෙකු මිය ගොස් අනෙක් තැනැත්තාට දෙමාපියකු ලෙස කටයුතු කළ නොහැකි හෝ නීත්‍යානුකූලව විවාහ නොවූ මවකට උපන් ළමයෙක් නම් මව මිය ගිය හෝ මව විසින් කටයුතු කළ නොහැකි තැනැත්තියකගේ ළමයෙකු අදහස් වෙයි.

**"අසරණ"** යන්නෙන් භාරය හා ආරක්ෂාව අවශ්‍ය රජයේ දෙපාර්තමේන්තු මගින් හෝ පළාත් පාලන ආයතනයක් මගින් හෝ ප්‍රධානය කරනු ලබන මහජන සහනාධාර ලබන දෙමාපියන්, දෙමාපියන්ගෙන් කෙනෙකු වෛද්‍ය සහතිකයක් අනුව රැකියාවක් කිරීමට නොහැකි තත්ත්වයකට පත් වූ රෝගී තත්ත්වයක සිටින හා අනෙකුත් තැනැත්තා ස්ථිර ආදායම මාර්ගයක් නැති හෝ දෙමාපියන්ගෙන් කෙනෙකු වෛද්‍ය සහතිකයක් මත මානසික රෝගියෙකු යැයි නිශ්චිත කර ඇති සහ අනෙක් තැනැත්තා ස්ථිර මාර්ගයක් නැති හෝ උසාවි නියෝගයක් මත හෝ වෙනත් ආකාරයකින් දෙමාපියන්ගෙන් වෙන් වූ පවුලක ළමයින් භාරකාරීත්වය දරණ මවට හෝ පියාට හෝ ස්ථිර ආදායම් මාර්ගයක් නැති හෝ වෙනත් ආධාරයක් නොලැබුණද ආධාරයක් ලැබීම අවශ්‍ය බව ග්‍රාම නිලධාරී හෝ පරිවාස නිලධාරී විසින් තහවුරු කරනු ලබන දෙමාපියකුගේ දරුවෙකුත් ළමයෙකුද යන්න අදහස් වේ (වයඹ පළාත් සභාවේ වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිළිබඳ ප්‍රඥප්තිය, 2018).

අපයෝජනය සූරා කෑම හා නොසැලකිල්ල භාජනය වීමේ අවදානමට ගොදුරුවන දරුවෙකු හඳුනාගත් නිලධාරියා අනිවාර්යෙන්ම සිද්ධි සේවකයා ලෙස සැලකෙන අතර සිද්ධි කළමනාකරුවෙකු ද ලෙස සලකනු ලබන්නේ ඔහු හෝ ඇය පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව හෝ පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව හෝ ජාතික ළමාරක්ෂක අධිකාරිය හෝ ළමාරක්ෂක අධිකාරිය හෝ යටතෙහි සේවය කරන්නේ නම් පමණකි. ළමුන්ට එරෙහි සියලු ආකාරයේ හිංසනයන්ට මුල්වන අවදානම් සාධක සහ ප්‍රධාන හේතූන් ප්‍රධාන කොටස් 05 ක් යටතේ හඳුනා ගෙන ඇත. ඒවා නම්, මනෝ විද්‍යාත්මක, සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනික කාරණා ලෙසයි. මෙම හිංසනයන්ගෙන් අවදානම් සහිත දරුවන් ආරක්ෂා කර ගැනීම උදෙසා සිද්ධි අධ්‍යන මාර්ගෝපදේශනය අනුව ඉහත නිලධාරින් කටයුතු කිරීම අපේක්ෂා කරනු ලබයි (ජාතික සිද්ධි කළමනාකරණ මාර්ගෝපදේශ, 2018).

ශ්‍රී ලංකාව, එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අත්සන් කර ඇති සාමාජිකයකු වන බැවින් අවම වශයෙන් ළමා රැකවරණය සහ ආරක්ෂාව පිළිබඳ අවම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය. ප්‍රඥප්තියට අනුව සියලුම දරුවන් පවුල් ජීවිතයට පවුල් සම්බන්ධතාවලට සහ ඔවුන්ගේ යහපත සඳහා නොවන බව ඔප්පු වුවහොත් මිස තම භාරකරුවන් සමග ජීවත්වීමට අයිතියක් ඇත. සංගණනයට අනුව ආයතන ගත කරන විට ආයතනවල සිටි දරුවන්ගේ 92% දෙමාපියන්ගෙන් එක් අයෙකු හෝ දෙදෙනාම ජීවතුන් අතර සිටිති. ඔවුන්ගේ දෙමාපියන්ගේ හෝ භාරකරුවන් මුළු පවුලටම ප්‍රමාණවත් සහයෝගයක් ලබා දුන්නේ නම් මෙම දරුවන්ගෙන් බොහෝ දෙනෙක් ආයතනගතකරණයට යොමු නොවනු ඇතැයි ප්‍රශ්න කර ඇත. බොහෝ පවුල් නිදන්ගත දරිද්‍රතාවෙන් සිරවී අවිධිමත් ආදායමින් ජීවත් වන හෝ තම දරුවන් රැකබලා ගැනීමේ වෙනත් බාධාවන් ප්‍රධාන බාධාවන්ට ලක් වූ අය වෙති (ජයසේන සහ වෙල්ගම, 2022).

**න්‍යායාත්මක ප්‍රවේශය**

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කාර්යභාරයේ ඵලදායීතාවය ඇගයීමේ පර්යේෂණයකට අදාළව විශේෂයෙන්ම යූරී බ්‍රොන්ෆෙන්බ්‍රෙනර්ගේ පාරිසරික පද්ධති න්‍යාය (Urie Bronfenbrenner's Ecological Systems Theory), ඉතා ප්‍රබල න්‍යායාත්මක ප්‍රවේශයක් සපයයි. මෙම න්‍යාය මඟින් දරුවාගේ හෝ සේවාලාභියාගේ සංවර්ධනය සහ යහපැවැත්මට බලපාන විවිධ පාරිසරික ස්ථරයන් සහ ඒවායේ අන්තර් සම්බන්ධතා අවධාරණය කරයි. මෙම බ්‍රොන්ෆෙන්බ්‍රෙනර්ගේ පාරිසරික පද්ධති න්‍යායට අනුව, පුද්ගලයා හුදෙකලා ඒකකයක් ලෙස නොසැලකේ. ඒ වෙනුවට, ඔවුන්ගේ සංවර්ධනයට හා ක්‍රියාකාරීත්වයට බලපාන, එකිනෙකට සම්බන්ධ වූ පාරිසරික පද්ධති මාලාවක් තුළ ඔවුන් සිටින බව පෙන්වා දෙයි. මෙම පාරිසරික පද්ධති න්‍යාය පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සහ එහි ඵලදායීතාවය විශ්ලේෂණය කිරීමේදී ඉතා වැදගත් වේ.

ප්‍රධාන පරිසර පද්ධති ස්ථර පහක් මෙහිදී හඳුනාගත හැකිය.

### 1. ක්ෂුද්‍ර පද්ධතිය (Microsystem)

මෙය පුද්ගලයාට ක්ෂණිකවම බලපාන ආසන්නතම පරිසරයයි. පරිවාස හා ළමාරක්ෂක සේවා සන්දර්භය තුළ, ක්ෂුද්‍ර පද්ධතියට ඇතුළත් වන්නේ,

- පවුල, පාසල, ළමා සංවර්ධන මධ්‍යස්ථානය, මිතුරු කව, ළමා නිවාස, පරිවාස භාර ස්ථාන, පරිවාස නිලධාරීන්/ළමාරක්ෂක නිලධාරීන් ආදිය යි.

### 2. මධ්‍ය පද්ධතිය (Mesosystem)

මෙය ක්ෂුද්‍ර පද්ධති කිහිපයක් අතර පවතින අන්තර් සම්බන්ධතා සහ අන්තර් ක්‍රියාකාරීත්වයන් වේ.

- පවුල සහ පාසල අතර සම්බන්ධය, පරිවාස භාර ස්ථානය සහ පවුල අතර සම්බන්ධය

- ළමා නිවාසයක සිටින දරුවෙකුට පවුල සමඟ ඇති සම්බන්ධතා පවත්වා ගැනීමට දෙපාර්තමේන්තුව උදව් කරන්නේ කෙසේද? උදා: දෙමාපියන් හමුවීමට අවස්ථා සැලසීම
- පරිවාස නිලධාරීන් සහ අනෙකුත් ක්ෂුද්‍ර පද්ධති (උදා: පොලීසිය, රෝහල්) අතර සම්බන්ධීකරණය

### 3. බාහිර පද්ධතිය (Exosystem)

මෙය පුද්ගලයා සෘජුවම සම්බන්ධ නොවූවත්, ඔහුගේ ක්ෂුද්‍ර පද්ධතියට බලපාන පුළුල් සමාජ ව්‍යුහයන් සහ පරිසරයන් වේ. පරිවාස හා ළමාරක්ෂක සේවා සන්දර්භය තුළ, මෙයට ඇතුළත් වන්නේ,

- දෙමාපියන්ගේ/භාරකරුවන්ගේ රැකියා ස්ථාන: දෙමාපියන්ට රැකියාව අහිමිවීම, ආර්ථික දුෂ්කරතා හෝ රැකියා ස්ථානයේ පීඩනය දරුවාගේ යහපැවැත්මට බලපාන ආකාරය. දෙපාර්තමේන්තුව මේ සඳහා ආධාර කරන්නේ කෙසේද? අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල මැදිහත්වීම
- ප්‍රාදේශීය ප්‍රජා සේවා, මාධ්‍ය මඟින් ළමා ආරක්ෂාව පිළිබඳව සමාජයේ ආකල්ප සහ දැනුවත්භාවය ගොඩනඟන ආකාරය සහ එය දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වයට බලපාන ආකාරය හා ළමා අපයෝජන අවම කිරීමට දක්වන දායකත්වය
- රජයේ ප්‍රතිපත්ති සහ තීරණ: පළාත් මට්ටමේ ගනු ලබන තීරණ පරිවාස හා ළමාරක්ෂක සේවාවන්ට බලපාන ආකාරය. බාහිර පද්ධතිවල බලපෑම හේතුවෙන් දෙපාර්තමේන්තුවට මුහුණ දීමට සිදුවන අභියෝග සහ අවස්ථා හඳුනා ගැනීම

### 4. මහා පද්ධතිය (Macrosystem)

මෙය පුද්ගලයා ජීවත් වන සමාජයේ පුළුල් සංස්කෘතික සාරධර්ම, විශ්වාස, නීති, සම්ප්‍රදායන්, දේශපාලන හා ආර්ථික පද්ධති නියෝජනය කරයි. පරිවාස හා ළමාරක්ෂක සේවා සන්දර්භය තුළ, මෙයට ඇතුළත් වන්නේ:

- ළමා ආරක්ෂාව, පරිවාස කටයුතු, සහ සමාජ සුභසාධනය සම්බන්ධ ජාතික ප්‍රතිපත්ති, නීති
- සංස්කෘතික විශ්වාස: ළමා ඇතිදැඩි කිරීම, දඬුවම් කිරීම, සහ පවුල් ව්‍යුහයන් පිළිබඳ සමාජයේ පවතින සංස්කෘතික විශ්වාස දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම්වලට බලපාන ආකාරය
- ජාතික ආර්ථික තත්ත්වය: රටේ සමස්ත ආර්ථික තත්ත්වය, සම්පත් වෙන් කිරීම, සහ එය දෙපාර්තමේන්තුවේ සේවාවන් සැපයීමට බලපාන ආකාරය
- එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (UNCRC) වැනි ජාත්‍යන්තර සම්මුතීන් ශ්‍රී ලංකාවේ ළමාරක්ෂක සේවාවන්ට බලපාන ආකාරය

### 5. කාල පද්ධතිය (Chronosystem)

මෙය පුද්ගලයාගේ ජීවිත කාලය තුළ සිදුවන වෙනස්කම්, ඓතිහාසික සිදුවීම්, සහ පරිසරයේ සිදුවන කාලීන වෙනස්කම් නියෝජනය කරයි.

පාරිසරික පද්ධති න්‍යාය මඟින් පරිවාස හා ළමාරක්ෂක සේවාවන්හි ඵලදායීතාවය තක්සේරු කිරීමට අවශ්‍ය රාමුව සපයන අතර සේවාලාභියාගේ යහපැවැත්ම විවිධ අන්තර් සම්බන්ධිත පද්ධති මඟින් හැඩගස්වන ආකාරය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා දෙයි. මෙය පර්යේෂණයට වඩාත් සමෝධානික සහ යථාර්ථවාදී ප්‍රවේශයක් ලබා දෙනු ඇත.

**ද්විතියික දත්ත විශ්ලේෂණය**

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් 2020.01.01 දින සිට භෞතික කටයුතු ආරම්භ කරමින් 2020.12.31 වෙන දින අපේක්ෂිත වැඩ නියම කරන ලද ඵලදායි සමීක්ෂණයක් ලෙස ළමා රැකවරණ මධ්‍යස්ථානයින්හි සිටින අවදානම් සහගත ළමුන් පිළිබඳව සිදුකරන ලද සමීක්ෂණය හැඳින්විය හැකිය. ඒ සඳහා රුපියල් මිලියන 5,208 මුදලක් වැයකර ඇති අතර මෙම කටයුත්තේ ජන ජන හා සංඛ්‍යාල ලේඛන දෙපාර්තමේන්තුවේ හා පරිවාස හා ළමාරක්ෂක කටයුතු අධිකාරියේ ඒකාබද්ධතාවයෙන් සිදු කරන ලදී (වාර්ෂික කාර්ය සාධන වාර්තාව, 2020).

වගුව **01**

**දරුවන් ආයතගත වීමේ වාර්ෂික සාමාන්‍ය**

| වර්ෂය | ළමුන් සංඛ්‍යාව | දරුවන් ආයතගත වීමේ වාර්ෂික සාමාන්‍ය |
|---|---|---|
| 2000- 2004 | 111 | 27.75 |
| 2005- 2009 | 687 | 171.75 |
| 2010 – 2014 | 2,327 | 581.75 |
| 2015 – 2017 | 3,002 | 1,501 |
| 2018 | 1,592 | 1,592 |
| 2019 | 2,044 | 2,044 |

මූලාශ්‍රය :ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

2015 - 2017 වර්ෂය වලදී දරුවන් 3,002 ක් පරිවාසගතවී ඇති අතර එහි සාමාන්‍ය 1,5001 කි. නමුත් වර්ෂයක් ලෙස ගත්කළ 2018 දී එය 1,592 ක් හා 2019 දී එය 2,044 කි.එහි මූලික සොයාගැනීම නම් ශ්‍රී ලංකාවේ ආයතනගත දරුවන් ප්‍රමාණය සීඝ්‍ර ලෙස වර්ධනය වී ඇති ආකාරයක් පෙන්නුම් කරයි.

පරිවාස හා ළමාරක්ෂණ සේවා දෙපාර්තමේන්තුවේ, වර්ෂ 2019 – 2023 කාර්ය සාධන වාර්තාවන් අනුව, ද්විතියික දත්ත විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන විශේෂ කාරණයක් ඇත. පරිවාසගත දරුවන්ගේ ළමා නිවාස අධීක්ෂණය තුළින් හඳුනාගන්නා අවශ්‍යතා සඳහා සහ අවම ප්‍රමිතීන් යටතේ සේවය සැපයීමේ දී අවශ්‍ය රාජ්‍ය මූල්‍ය සහාය ලබා දීමට රජය වාර්ෂික අයවැයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් වෙන් කර ඇති බවයි. වර්ෂ 2021 හා 2022 වර්ෂයේ දී එය සැලකිය යුතු ගණනකින් වර්ධනය වී ඇති අතර, 2023 වර්ෂයේ දී රටේ පැවති අස්ථාවර ආර්ථික තත්ත්වය හමුවේ යම්තාක් දුරකට මූල්‍ය වෙන් කිරීම් අඩු වී ඇත. හඳුනාගත් දරුවන් නැවත සමාජගත කිරීමේ විශේෂ මැදිහත් වීමේ කාර්යභාරය සඳහා වාර්ෂිකව මුදල් වෙන වී ඇති අතර එහි සාධනීය ප්‍රගතියක් පෙන්නුම් කරයි. 2022 වර්ෂයේ දී එය රු. මිලියන 2.00 කි (කාර්ය සාධන වාර්තාව, පරිවාස හා ළමාරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව, 2019 – 2023).

පසුගිය වසර 05 තුළ පරිවාස හා ළමා රක්ෂණ ආයතයේ අනුමත වියදම් ශීර්ෂයන්හි භෞතික අනුව 2022 වර්ෂයේ දී හඳුනාගත්, දරුවන් නැවත සමාජගත කිරීම ප්‍රශස්ථ වර්ධනයක් පෙන්නුම කරයි. එම දරුවන් ගණන 34 කි (කාර්ය සාධන වාර්තාව, පරිවාස හා ළමාරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව, 2019 – 2023). අනාථ, අසරණභාවයට පත් දරුවන්ට පිළිසරණක් සපයන මෙම රාජ්‍ය ආයතනයේ කාර්ය භාරය අතරට මෙම සේවා සැපයීම ඉදිරියෙන් සිටි. ඒ අනුව වාර්ෂිකව ඉහළ යන ආයතනගත දරුවන් සමාජගත කිරීමේ මුඛ්‍ය පරමාර්ථය ඉටු කර ගැනීම උදෙසා වාර්ෂිකව මැදිහත් වීමේ සැලසුම් ක්‍රියාත්මක කිරීම කාලෝචිත වේ. මෙහිදී එම දරුවන්ට වෘත්තීය පුහුණුව සැපයීම, වැඩිදුර අධ්‍යාපනය සැලසීම, තම පවුල සමග එකතු කිරීමට ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම යානා දී

කාරණාවලදී සමාජ වැඩකරුගේ මැදිහත් වීම ප්‍රයෝගිකව යොදා ගැනීම තවදුරටත් සිදු කළ හැකිය. මෙම ආයතනයේ ආයතනික ව්‍යුහය කාර්ය සාධන වාර්තාවේ දක්වා ඇති අතර එහි සමාජ වැඩකරුගේ මැදිහත්වීමක් පෙන්නුම් නොකරන අතර, මෙම පර්යේෂණය මගින් එම ආයතනයෙහි ඵලදායිතාව මැන බැලීමේ දී සමාජ වැඩකරුගේ වෘත්තීය මැදිහත්වීමක් අත්‍යවශ්‍ය බව පැහැදිලි විය.


**වගුව 02**

ළමුන්ගේ ආරක්ෂාව සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම සඳහා විදේශ ආධාර ලැබීම්

| වර්ෂය | ළමුන්ගේ ආරක්ෂාව සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම සඳහා විදේශ ආධාර ලැබීම් රු.මිලියන | යුනිසෙෆ් වැඩ සැලැස්ම රු.මිලියන |
|---|---|---|
| 2019 | 7.65 | 0 |
| 2020 | 8.122 | 0 |
| 2021 | 20.612 | 4.1 |
| 2022 | 1.8652 | 10.684 |
| 2023 | 0 | 14.526 |

මූලාශ්‍රය : කාර්ය සාධන වාර්තාව, පරිවාස හා ළමාරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව, 2019 - 2023

වගු අංක 02 ට අදාළ ප්‍රස්ථාර සටහන




වාර්ෂික අයවැය මගින් වැය ශීර්ෂ 217 යටතේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපර්තමෙන්තුව සඳහා මුදල් වෙන් කරනු ලබන අතර, එහි සියලු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා එම මුදල් ප්‍රමාණවත් නොවන අතර, ළමුන් සඳහා ක්‍රියාත්මක ක්‍රියාකාරී සැලැස්ම සඳහා විදේශ ආධාර ලැබීම් ප්‍රධාන ආකාර කිහිපයකින් දක්නට ලැබේ. මෙහිදී

පසුගිය වර්ෂ 05 තුළ දී ලද, ළමුන්ගේ ආරක්ෂාව සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම සඳහා විදේශ ආධාර ලැබීම් හා යුනිසෙෆ් වැඩ සැලැස්ම ටතේ ප්‍රගතිය ඉහත ප්‍රස්ථාර සටහන මගින් දක්වා ඇත. පසුගිය වර්ෂ 05 ට අදාළව 2021 හා 2022 වර්ෂයන්හිදී විදේශ ආධාර දෙයාකාරයකින්ම ලැබී ඇති අතර 2021 වර්ෂයේ දී ළමුන්ගේ ආරක්ෂාව සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම සඳහා විදේශ ආධාර ලැබීම් රු.මිලියන 20.612 ක් හා වර්ෂ 2023 දී යුනිසෙෆ් වැඩ සැලැස්ම යටතේ රු. මිලියන 14.526 ක ප්‍රමාණයක් ලැබීම ආයතනික කාර්යයඵලයට මෙන්ම දරුවන් සඳහා ලද විශාල ජයග්‍රහණයකි. එමෙන්ම 2023 වර්ෂයේදී ආයතනගත දරුවන් වෙනුවෙන්, ආසියානු සංවර්ධන බැංකුව මගින් රු. මිලියන 21.305 ක මුදලක් ලබා දෙමින් ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය සංවර්ධනය ප්‍රතිසාධනය හදිසි ආධාර ව්‍යාපෘතිය (ADB) ක්‍රියාත්මක කරන ලදී (කාර්ය සාධන වාර්තාව, පරිවාස හා ළමාරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව, 2023).

**වගුව 03**

2019 වර්ෂය වන විට ශ්‍රී ලංකාව තුළින් ළමා ආරක්ෂක ආයතන පිහිටුවා ඇති ආකාරය

| ආයතන වර්ගය | ආයතනය ගණන |
|---|---|
| රිමාන්ඩ් නිවාස | 14 |
| ආරක්ෂිත නිවාස | 4 |
| සහතික කල පාසැල් | 9 |
| අනුමත පාසල් | 1 |
| රජයේ භාරයේ රදවා ගැනීම් නිවාස | 9 |
| රැඳවුම් නිවාස | 1 |
| පුහුණු හා උපදේශන මධ්‍යස්ථාන | 4 |
| ස්වේච්ඡා ළමා නිවාස | 331 |
| වෙනත් | 6 |
| එකතුව | 379 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2019

රජය විසින් පවත් පවත්වාගෙන යනු ලබන පුහුණු හා උපදේශන මධ්‍යස්ථාන 04 ට ඇතුළත් කරගන්නා ළමුන් සඳහා වෘත්තීය පුහුණුවක් සහ මනෝ සමාජීයය සහාය ලබා ලබා දේ. ශ්‍රී ලංකාවේ විශාලතම නිවාස ප්‍රමාණය ස්වේච්ඡා ළමා නිවාසවලින් සමන්විත වේ. දැනට රට පුරා පුද්ගලික හෝ පුද්ගලික හෝ ලාභ නොලබන සංවිධාන විසින් කළමනාකරණය කරනු ලබන ස්වේච්ඡා ළමා නිවාස සංඛ්‍යාව 331 ක් වන අතර එය ශ්‍රී ලංකාවේ මුළු ළමා ආරක්ෂක ආයතන සංඛ්‍යාවෙන් 87.3% කි. මෙම සංඛ්‍යාව කළමනාකරණය කරනු ලබන්නේ පුද්ගලිකයින් අංශය හෝ කණ්ඩායමක් විසින් වුවද

මේවා අධීක්ෂණය කිරීම සෘජුවම අදාළ පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ සිදුවේ (ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2019).

වර්ෂ 2019 දී පවත්වන ලද මෙම සංගණනයට අනුව ළමා අයිතිවාසිකම් පිළිබඳ කාරක සභාවට සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයේ හිඟකම, පුහුණුව නොමැති සේවකයින් සිටීම සහ විශේෂයෙන් ආයතනවල ප්‍රමාණවත් අධීක්ෂණය නොමැතිවීම උදාහරණයක් ලෙස ලියාපදිංචි හෝ ලියාපදිංචි නොකළ ආයතන හෝ ස්වේච්ඡා නිවාස සඳහා අධීක්ෂණ යන්ත්‍රයක් නොමැති බව දැකගත හැකි අතර, රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනය සහ ස්වේච්ඡා නිවාස සඳහා ක්‍රියාකාරී ප්‍රතිපත්ති මාලාවක් ස්ථාපිත කර ඒවා නිරන්තරෙන් අධීක්ෂණය කළ යුතු බවට නිර්දේශය කර ඇතත් එය ප්‍රායෝගිකව සිදු නොවන බවට පෙනී ගොස් ඇත. ළමුන්ගේ ධාරිතාව අනුව නියමිත ප්‍රමිතියට අනුව සේවක සංඛ්‍යා වැඩි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අදාළ බලධාරීන් විසින් නියම කර ඇති අතර, දරුවන්ගේ චිත්ත වේගී කළමනාකරණ හා මනෝ සමාජීය නිපුණතා ඇති කිරීමේ යාන්ත්‍රනය ශක්තිමත් කිරීම තුළින් සමාජයට වැඩදායි පුරවැසියෙකු ලබා දීමේ කටයුත්ත සිදු කිරීම කළ යුතුය.

**නිගමන**

දරුවන් ආයතනගත ක්‍රියාවලිය පවත්වාගෙන යාමේ දී දරුවන් සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවක් සැපයීම, වෘත්තීය පුහුණු අවස්ථා වැඩි කිරීම, පුහුණු සේවකයින් වැඩි කිරීම, එහි යටිතල පහසුකම් තවදුරටත් වැඩි කිරීම වැනි ප්‍රධාන කාරණා වැඩිදියුණු කිරීමට රාජ්‍ය, රජය නොවන මැදිහත්වීම වැඩි කිරීම තවදුරත් සිදු කළ යුතු බව මෙම පරීක්ෂණය සිදු කිරීම මගින් මනාව පැහැදිලි විය. ළමාරක්ෂක ආයතනවල ළමුන් ආයතනගත දරුවන් ඉතා කුඩා අවදියේදීම කායිකව හා මානසික දරුණු තත්ත්වයන්ට ගොදුරු වූවෝ වෙති. ආයතනගතකරණය දරුවාගේ යහපැවැත්ම සහ මානසික තත්ත්වයට බලපාන බොහෝ සෘණාත්මක බලපෑම් ඇත. දරුවන් තම පවුල්වලින් නෙරපා දැමීම එදිනෙදා සබඳතා සහ බැඳීම් ඇතිකර ගැනීමට දරුවාට ඇති හැකියාවෙහි තීරණාත්මක බලපෑමක් සිදු කරයි. මෙම ආයතන බොහොමයක් නිතිපතා අධීක්ෂණයට ලක් නොවන අතර පරීක්ෂාවට ලක් කරන ලද දරුවන් නොසලකා හැරීමට හා අපයෝජනයන්ට ලක්වීමේ අවදානමක් ඇත. මේ සම්බධයෙන් රාජ්‍ය තීරණ ලබා ගැනීමට යෝජනා ඉදිරිපත් කිරීම සඳහා සමාජ වැඩකරුගේ මැදිහත්වීම අත්‍යවශ්‍ය කරුණකි.

එමෙන්ම මෙම පර්යේෂණය ද්විතියික දත්ත මත පදනම වූ පර්යේෂණයක් වන අතර, මෙහිද සීමාවන් දැකගත හැකි විය. ඒවා අතර, ළමා නිවාසවල ජීවත්වන දරුවන්ගේ ගැටලුකාරී තත්ත්වයන් සෘජුව හඳුනා ගැනීමට නොහැකි වීම, ආයතනික නිලධාරිගේ ගැටළු හඳුනා ගැනීම සඳහා සම්මුඛ සාකච්ඡා පැවැත්වීමට අවස්ථාවක් නොලැබීම, ළමුන්ගේ කුසලතා වර්ධනයෙහි ප්‍රගතියක් හා ඔවුන්ගේ අධ්‍යාපනික හා වෙනත් සමාජීය, කායික අවශ්‍යතා හඳුනා ගැනීමට නොහැකි වීම හා ළමා රක්ෂක සේවාවන් ක්ෂේත්‍රයේ පවතින ප්‍රයෝගික ගැටළු හා වර්තමාන ඵලදායිතාවයේ ප්‍රගතිය ප්‍රයෝගිකව මැන බැලීමට අවස්ථාවක් අත් නොවීම මෙහිදී සඳහන් කළ යුතුය.

පරිවාස හා ළමා රක්ෂක සේවා ආයතනයෙහි කාර්යසාධන වාර්තා පැවතිය ද එහි වාර්ෂික ප්‍රගතියෙහි සන්සන්දනාත්මක ඉදිරිපත් කිරීමක් සිදු කර නොමැත. ඒ අනුව දරුවෙකු ආරක්‍ෂිත පරිසරයක හදාවඩා සමාජයට දායාද කිරීමේ දී දෙමාපියන්ගේ, වැඩිහිටියන්ගේ හා අනෙකුත් පරිසර පද්ධතියේ සමාජ වගකීම තේරුම ගැනීමටත්, ආයතනගත වන දරුවෙකු නිසි වයස පැමිණීමත් සමග සමාජගත කිරීමේ කාර්යයේදී රාජ්‍ය යාන්ත්‍රණයේ වගකීම්, රාජකාරි, කාර්යයන්හි ඵලදායිතාව නිශ්චය කිරීම තුළින් ලබා දෙන සේවාවන්හි යාවත්කාලින කළ යුතු කාරණා තේරුම් ගැනීමටත්, ළමා රක්ෂක කාර්යේදී රාජ්‍ය අරමුදල් වෙන් කිරීමේදී කාර්යක්ෂමව මුදල් වෙන් කල යුතු අංශ කෙරෙහි මනා අවබෝධයක් ලබා ගැනීමටත්, වැඩිදියුණු කලයුතු අංශ ප්‍රතිපත්තිමය වශයෙන් හඳුනා ගැනීමටත් මෙවැනි පර්යේෂණ මනා පිටුවහලක් වනු ඇත.

එසේම, සමාජයේ සංවේදී පිරිසක් වූ දරුවන් උදෙසා සිදු කරන ආයතගතකරණය හා සම්බන්ධ රාජකාරියේදී එහි පරමාර්ථ ඉටු කර ගැනීමේ කාර්යභාරයට සමාජ වැඩකරුවකුගේ මැදිහත්වීම කාලෝචිත වේ. ශ්‍රී ලංකාව වැනි රටක වෘත්තීය සමාජ වැඩකරුගේ පිළිගැනීම අවම මට්ටමක පැවතියත්, ස්වශක්තියෙන් නැගීසිටින දරුපරපුරක් නිර්මාණය කිරීමට පරිවාස හා ළමාරක්ෂක ආයතන සඳහා තම සේවාව සැපයිය හැකිය. එසේම අවධානම් සහගත දරුවන් හඳුනා ගෙන එම දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට මැදිහත්කරණ කාර්ය සිදු කළ හැකිය. ආයතනගත දරුවන්ගේ ආකල්ප වෙනස් කරන්නෙකු ලෙස කටයුතු කළ හැකිය. ආයතනගත දරුවන්ගේ දෙමාපියන් තුළද ධනාත්මක ආකල්ප ඇති කරන්නෙකු ලෙස ක්‍රියා කළ හැකිය. ළමා අයිතීන් ආරක්ෂා කිරීමට පෙනී සිටින්නෙකු ලෙස ක්‍රියා කළ හැකිය. දරුවන්ගේ විභව ශක්තින් හඳුනා ගන්නා අභිප්‍රේරකයෙක්, සම්බන්ධිකාරකයෙක් හා සැබෑ නායකයෙකු ලෙසද කටයුතු කරමින් ආයතනගත දරුවන්ගේ අනාගත ජීවිතය ඵලදායි කිරීමේ කටයුත්තට සමාජ වැඩකරුට ඵලදායි ලෙස මැදිහත් විය හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


අදිකාරි, ඒ. එම්. කේ. එල්. (2019). ආයතනගත වී ඇති දරිවියන්ගේ මානසික ගැටළු සඳහා සමාජ වැඩ වෘත්තීය මැදිහත්වීම පිළිබඳ අධ්‍යයනයක්. ජාතික සමාජ සංවර්ධන සඟරාව.

අතුකෝරල, දයා රෝහණ. (1998). ළමා මනෝ විද්‍යාව සහ ළමා සංවර්ධනය. කොළඹ: ශික්ෂා මන්දිරය.

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය. (1999). කොළඹ: ජාතික ළමාරක්ෂක අධිකාරිය.

කුරේ, ක්‍රිෂාන්ත් නිරංජන්. (2005). ශ්‍රී ලංකාවේ සිදුවන ළමා අපයෝජන.

කැටිපෙආරච්චි, ආර්. සී. (2019). අපයෝජනය වූ දරුවන් උදෙසා මනෝ සමාජීය මැදිහත්කරණය. ජාතික සමාජ සංවර්ධන සඟරාව, දෙවන කලාපය.

ජන හා සංඛ්‍යාව ලේඛන දෙපාර්තමේන්තුව. (2019). සංගණන වාර්තාව. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව.

ප්‍රේමසිරි, එස්. (2006). ළමා අපයෝජන පිටුදකිමු. සමයවර්ධන ප්‍රකාශකයෝ, කොළඹ 10.

වැදිසිංහ, කේ. එස්. (2019). පවුල් හිංසනය හමුවේ දරුවන් මුහුණ දෙන අභියෝග සඳහා සමාජ වැඩ මැදිහත්වීම. ජාතික සමාජ සංවර්ධන සඟරාව, දෙවන කලාපය.

සුබසිංහ, ඩබ්. (2022). සමාජ පර්යේෂණ ක්‍රම.

සිරිකුමාර, සන්දාා, එච්. කේ. (2017). ශ්‍රී ලංකාවේ ආයතනගත ළමුන් උදෙසා කිරීම සඳහා සමාජ වැඩ වෘත්තියේ මැදිහත් වීම. ජාතික සමාජ සංවර්ධන සඟරාව, දෙවන කලාපය.

ළමා අයිතිවාසිකම් පිළිබඳ අත් පොත. (2018). ජනාධිපති කාර්යාලය සහ ජාතික ළමා රක්ෂණ අධිකාරිය.

ළමා නිවාස ළමුන් පිළිබඳ සංගණන වාර්තාව. (2019). පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපර්ත්මෙන්තුව.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපර්තමෙන්තුව. (2019). Census of Children in Child Care Institutions 2019. Retrieved from https://drive.google.com/file/d/1e-lpxrrkyGeL9wMsFST-Ojb32Y28kwv-/view (Accessed: 10.06.2025)

United Nations Children's Fund. (n.d.). What is social protection. Retrieved from https://www.unicef.org/srilanka/media/4721/file/Social%20Protection_ABC%20flyer%20SIN.pdf.pdf (Accessed: 25.05.2025)

United Nations. (n.d.). Convention on the Rights of the Child. Retrieved from https://probation.gov.lk/index_s.php (Accessed: 25.05.2025

Wijekoon, B. B. (2024). Sri Lankan children's films: A genre overview. https://www.researchgate.net/publication/382027897_Sri_Lankan_Children%27s_Films_A_Genre_Overview